රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 04/2009

මගේ අංකය : ආ/8/5/719/30
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

2009 පෙබරවාරි මස 26 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**<u>බරවාහන රියදුරු බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු</u>**

1986 සැප්තැම්බර් මාසයෙන් පසුව නිකුත් කරන ලද බර වාහන රියදුරු බලපත්‍ර වසර 03 කට වරක් අළුත් කළ යුතු අතර ඒ සඳහා වැයවන මුදල ප්‍රතිපූර්ණය කිරීම පිණිස නිකුත් කර ඇති 2002 ජූනි මස 20 දිනැති අංක 03/2002 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2009.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I | රියදුරු බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තුව | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නියම කරනු ලබන ගාස්තුව |
| II | සභාපති, ජාතික ප්‍රවාහන වෛද්‍ය අංශය වෙත ගෙවනු ලබන ගාස්තුව | රු.450/- |
| III | ඡායාරූප සඳහා ගාස්තුව | රු.200/- |

02. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරන ලදී.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය